IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - I කොටස - 2016/2017

(දෙවන සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2019 ජූනි)

## BLE 108 - තොරතුරු සන්නිවේදන තාක්ෂණය 1

අයදුම්කරුවන්ට උපදෙස් :

(1) **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සැපයිය යුතුය. පළමු ප්‍රශ්නයට මෙම ප්‍රශ්න පත්‍රයේම පිළතුරු සපයා උත්තර පත්‍රයේ අගට අමුනන්න.**

(2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතකින් (07) සහ පිටු පහකින් (05) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි. (03)

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

01. නිවැරදි ප්‍රශ්නයට යටින් ඉරක් අඳින්න.

i) පරිගණක පද්ධතියක් ලෙස ඔබ හඳුන්වන්නේ

a) Input/output devices b) CPU c) Memory d) ඉහත සියල්ලම

ii) ALU යන උපකරණය මගින් සසඳනු ලබන්නේ

a) අකුරු b) ඉලක්කම් c) විශේෂිත සංකේත d) ඉහත සියල්ලම

iii) පහත දැක්වෙන කවරක් තාවකාලික මතකය ලෙස හඳුන්වනු ලබයිද?

a) RAM b) ROM c) P ROM d) ඉහත සියල්ලම

iv) පරිගණකයක් භාවිතා කරනු ලබන අයෙකු හට එම පරිගණකයට තොරතුරු ඇතුලත් කිරීමට භාවිතා කල හැක්කේ,

a) Plotter b) Printer c) Speaker d) Key Board

v) බැංකුවකදී චෙක්පත් නිශ්කාශනය සඳහා භාවිතා කරන්නේ පහත දැක්වෙන කවරක්ද?

a) OCR b) MICR c) OMR d) Bar Code Reader

vi) Output Devices කාණ්ඩයට අයත් වන්නේ පහත දැක්වෙන කවර උපකරණයද?

a) CU b) ALU c) Scanner d) Printer

vii) ආයතනයකදී පරිගණක දෙකක් හෝ කිහිපයක් එකට සම්බන්ධ කර තැබීම සඳහා භාවිතා කරන පද්ධතිය හඳුන්වන නම වන්නේ

a) Communication devices b) Internet

c) Network d) ඉහත කිසිවක් නොවේ.

viii) ප්‍රාදේශීයව විසිරී පවතින පරිගණක ජාලයක් හඳුන්වනු ලබන්නේ

a) LAN b) MAN c) WAN d) ඉහත කිසිවක් නොවේ.

ix) E mail මගින් තොරතුරු යැවීමේදී එකවර එම තොරතුරු කිහිප දෙනෙකු වෙත යැවිය හැකිය. එසේ යවනු ලබන තොරතුරු ලබා ගන්නා පුද්ගලයන් එකිනෙකා වෙත දැන ගැනීමට නොහැකි වනසේ ලිපිය යැවීම සඳහා භාවිතා කලයුතු වන්නේ ,

a) CC මගින් b) BCC මගින්

c) ඉහත a) හා b) මගින් d) ඉහත කිසිවක් නොවේ.

x) පරිගණකයක් ඇසුරෙන් වැඩිම තොරතුරු ප්‍රමාණයක් ගබඩා කල හැක්කේ

a) Floppy Disk b) CD (Compact Disk)

c) Pen Drive d) Hard Disk

Xi) තොරතුරු සන්නිවේදනය කිරීමේදී මිල අධික එහෙත් හොඳින් තොරතුරු හුවමාරු කළ හැකි මාධ්‍යයක් වන්නේ

a) Fiber Optics Cable  b) Coaxial Cable

c) Twisted Pair Cable  d) UTP Cable

Xii) CD Rom එකක් මගින් CD එකක තොරතුරු ගබඩා කිරීමට භාවිතා කරනු ලබන ක්‍රමය වන්නේ

a) Heat  b) Magnetism

c) Laser beam  d) ඉහත කිසිවක් නොවේ.

Xiii) වදන් සැකසුම යටතේ කවරක් අන්තර්ගත වේද?

a) Bold  b) Spell Checker

c) Aligning  d) ඉහත සියල්ලම

xiv) වදන් සැකසුම යටතේ ලිපියක් Save කිරීමේදි එහි නාමයේ අගට ලැබෙන්නේ පහත කවරක්ද?

a) doc  b) xls  c) mbd  d) txt

xv) වදන් සැකසුම යටතේ ලිපියක් ලිවීමේදී වචනයක් නිවැරදිදැයි (Spell checker) හඳුනා ගැනීමේදී යෝජනා කරනු ලබන වචන ගණන

a) 01  b) 02  c) 03  d) කිහිපයකි

xvi) පරිගණකය ඇසුරින් ලිපියක් ලිවීමේදී වඩාත් සුදුසුම මෘදුකාංගය වන්නේ

a) Front Page  b) Page Maker  c) Power Point  d) Word

xvii) වදන් සැකසුමක් යටතේ කල නොහැක්කේ

a) ලිපියක්  b) Memo එකක්  c) වාර්තාවක්  d) ප්‍රස්ථාරයක්

xviii) ලිපියක් ලිවීමේදී වම්පස හා දකුණුපස දෙපසම එකම රේඛාවක පවතින පරිදි ලේඛනය සකස් කිරීම හඳුන්වන්නේ

a) Left align  b) Right align  c) Justify  d) Center

xix) නිබල් (Nibal) එකක් යනු,

a) 0 orl  b) 1 bit  c) 4bit  d) 8 bit

xx) තනි පුද්ගලයෙකු භාවිතා කරන මෙහෙයුම් මෘදුකාංගයක් නොවන්නේ

a) DOS  b) Windows 95/97/98  c) Apple Mac  d) Linux

(ලකුණු 2x20= 40)

02. i ) පහත දැක්වෙන පරිගණක ජාලවල දළ රූප සටහන් ඇඳ එම එක එකක් සඳහා කෙටි පැහැදිලි කිරීම් කරන්න.

අ.) (Ring Network) වලලු ආකාරයේ පරිගණක පද්ධති

ආ.) (Star Network) තාරකා ආකාරයේ පරිගණක පද්ධති

ඇ) Bus Network

ඈ) රුක්සටහන් ආකාරයේ පරිගණක පද්ධති (Hierarchical Network)

(ලකුණු 20)

ii) දත්ත සම්ප්‍රේශණ මාධ්‍යය හතරක නම් ලියන්න. එයින් <u>දෙකක්</u> ගැන කෙටි සටහන් ලියන්න.

(ලකුණු 10)

iii) දත්ත සම්ප්‍රේශණය පිළිබඳ තාක්ෂණික කරුණු යටතේ සාකච්ඡා කරනු ලබන සංකල්ප හතරක් ඇත. ඉන් දෙකක් ප්‍රකාශ කරන්න.

(ලකුණු 05)

iv) භූමිය යටතේ පරිගණක ජාලවල වර්ගීකරණය කිරීමේදී භාවිතා කරන නම් මොනවාද? ඒවා භාවිතා කරන ස්ථාන සඳහා උදාහරණය බැගින් ලබා දෙන්න.

(ලකුණු 05)

03) i) පහත දැක්වෙන දහයේ පාදයේ සංඛ්‍යා දෙකේ පදයට හරවන්න.

අ.) 84 ආ) 10 ඇ) 200 ඈ) 500 ඉ) 650

(ලකුණු 05)

ii) පහත දැක්වෙන දෙකේ පාදයේ සංඛ්‍යා දහයේ පාදයට හරවන්න.

අ.) $1101_2$ ආ) $110010_2$ ඇ) $1110111_2$

ඈ) $11001010_2$ ඉ) $110101100_2$

(ලකුණු 05)

iii) පහත දැක්වෙන දෙකේ පදයේ සංඛ්‍යා සුළු කරන්න.

අ.) $1101_2 + 11001_2 + 1010111_2$

ආ) $110111_2 + 101101_2 - 101011_2$

ඇ) $110100_2 - 11011_2 + 11011001_2$

ඈ) $110_2 - 11010_2 + 11011011_2 - 10110_2$

ඉ) $1100_2 + 1010111_2 - 10111_2 - 10101_2$

(ලකුණු 15)

iv) පහත දැක්වෙන දෙකේ පදයේ සංඛ්‍යා ගුණ කරන්න.

අ.) $11011_2$ x $1011_2$

ආ) $1100101_2$ x $10011_2$

ඇ) $11001010_2$ x $11010_2$

ඈ) $11101011_2$ x $11001_2$

ඉ) $10101100_2$ x $11001_2$

(ලකුණු 15)

04) i) වදන් සැකසුම (Word Processor) යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද? වදන් සැකසුමක් භාවිතයේ වාසි හා අවාසි(කෙටියෙන්) ප්‍රකාශ කරන්න.

(ලකුණු 08)

ii) වදන් සැකසුමකදී "wrap Text" යන්න මගින් කවරක් අදහස් කෙරේද? සුදුසු උදාහරනයක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

iii) වදන් සැකසුමක ඇති විශේෂ ලක්ෂණ 5ක් (5) ලියන්න.

(ලකුණු 08)

iv) වදන් සැකසුමක "Find and Replace" යන්නෙහි වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 08)

v) වදන් සැකසුමකදී "Save" හා "Save As" අතර වෙනස් කම් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

05) i) අන්තර්ජාලය යනුවෙන් ඔබ අදහස්කරන්නේ කුමක්ද? කෙටියෙන් ප්‍රකාශ කරන්න.

(ලකුණු 10)

ii) අන්තර්ජාලය යටතේ

අ.) Domain name

ආ) E – Commerce යන ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

iii) පහත දැක්වෙන ඒවා ප්‍රසාරනය කර නැවත ලියන්න.

අ.) TCP/IP ආ) www. ඇ) HTTP ඈ) HTML

(ලකුණු 10)

iv) අන්තර්ජාලය ඇසුරෙන් අධ්‍යාපනය හා සෞඛ්‍යය යන අංශ වල සංවර්ධනයට බලපා ඇති ධනාත්මක වර්ධනයන් පිළබඳව කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 10)

06. i) පරිගණක භාෂා (Language) යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද?

(ලකුණු 08)

ii) Machine Language හා High Level Language යන ඒවා සඳහා කෙටි සටහන් ලියන්න.

(ලකුණු 08)

iii) High Level Language දෙකක නම් ලියන්න.

(ලකුණු 08)

iv) පරිගණක වැඩසටහනකදී " Compiler " යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

(ලකුණු 08)

v) Utility Software යනුවෙන් කුමක් අදහස් කරන්නේද?

(ලකුණු 08)

07. i) පරිගණක සදාචාරය (Computer ethics) යන්නෙන් කුමක් අදහස් කරන්නේද?

ii) ඩිජිටල් හඳුනා ගැනීම (digital Identification) යන්නෙන් කුමක් අදහස් කරන්නේද?

iii) පරිගණක අපරාධ (Computer Crimes) යන්නෙන් කුමක් අදහස් කරන්නේද?

iv) " පරිගණකය නිහඬ මාරයෙක්" යන්නෙන් ඔබ අදහස් කරන්නේද?

(ලකුණු 10x 4)

**********************